# අසමත් මීසම හා එක්සත් ජාතීන්ගේ හමුදා

ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුව යන නමින් සාමාන්‍යයෙන් හැඳින්වෙන ශ්‍රී ලංකා නිරීක්ෂණ මීසම (මොනිටරින් මිෂන්) යන්න තවත් අසමත් මීසමක් ලෙස ඉතිහාසයට එක්වනු වැළැක්වීමට බටහිර රාජ්‍ය ප්‍රබල උත්සාහයක් ගනු ඇත. මීසම පිහිටුවනු ලැබුයේ රනිල් වික්‍රමසිංහ මහතා හා ප්‍රභාකරන් අතර ඇතිවූ ඊනියා සටන් විරාම ගිවිසුම පදනම් කරගනිමින්ය. ඒ ගිවිසුමේ ප්‍රධාන අරමුණු දෙකක් වූ බව අපි ඒ දිනවල ම පෙන්වා දුන්නෙමු. ඉන් එකක් වූයේ ශ්‍රී ලංකා රජය හා කොටි සංවිධානය සම මට්ටමක ලා සැලකීමය. අනෙක රාජ්‍ය හමුදාව හා කොටි ත්‍රස්තවාදී නඩය සම මට්ටමකට දැමීමය. ඊනියා සටන් විරාමය නිරීක්ෂණය කිරීම සඳහා මීසම පිහිටුවන ලදී. එහි සාමාජිකයෝ නෝර්වේ, ස්වීඩනය ආදී රටවල පුරවැසියෝ වූහ.

ආරම්භයේ සිටම මීසම කොටින්ට පක්ෂපාතී විය. බොරු සටන් විරාමය කොටින්ට තම ශක්තිය වැඩිකර ගැනීම සඳහා දෙන ලද ඉඩක් පමණක් විය. කොටි මිනීමැරූ විට මීසමට ඒ බව ප්‍රකාශ කිරීමට තරම් ප්‍රමාණවත් සාධක නොවීය. එහෙත් රජය හෝ රජයේ හමුදා හෝ විවේචනය කිරීමට අවශ්‍ය වූ විට මීසමට ඒ එතරම් ප්‍රශ්නයක් නොවීය. එසේ වුවද රනිල් වික්‍රමසිංහ මහතාගේ ආණ්ඩුව පමණක් නොව චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ ආණ්ඩුවද ඒ සියල්ල නිවටව ඉවසා සිටියේය. එහෙත් මීසමේ පක්ෂග්‍රාහී කටයුතු තවදුරටත් ඉවසා සිටීමට අභිමානයක් ඇති කිසිම ආණ්ඩුවකට කළ හැකි දෙයක් නොවේ.

පසුගියදා ඔස්ලෝහි පැවැත්වීමට නියමිතව තිබූ සාකච්ඡාව නිමිත්තෙන් මීසම නිකුත් කළ ප්‍රකාශයකින් කියා පෑමට තැක්කර ඇත්තේ ජිනීවා සාකච්ඡාවලින් පසුව ඇතිවූ ප්‍රචණ්ඩත්වයට හේතුව පසුගිය අප්‍රියෙල් හත්වැනිදා සිදුකරන ලද විග්නේස්වරන් ඝාතනය බවය. එයට වගකිවයුත්තා රජය බව මීසම වෙහෙන් ඔරෝ භාෂාවෙන් කීමට තැත්කරයි. මීසමේ කටයුතු සිදුවන ආකාරය ඉතාමත් අසතුටුදායකය. මෙවර ඔස්ලෝ ප්‍රකාශයට ආණ්ඩුව තම තදබල විරෝධය පළකර ඇත. එය අගය කළ යුතු අතර මීසම ගෙදර යැවීමට ආණ්ඩුවට බල කිරීමට ජාතික බලවේග සමත් විය යුතුය.

ඒ කෙසේ වෙතත් මීසම අසමත් මීසමක් බවට පත්වී ඇත. මීසමෙන් විජාතික බලවේග බලාපොරොත්තු වූයේ ඊළම පිහිටුවීම සඳහා හෝ එහි පියවරක් ලෙස සහසන්ධීය රාජ්‍යයක් පිහිටුවීම සඳහා හෝ අවශ්‍ය සාධක එක්රැස් කරගැනීමය. මීසම කොටින්ට සුදුහුණු ගෑමත් ආණ්ඩුවට වරද පැටවීමත් ඊනියා සාධක සහිතව සාර්ථකව සිදු කරනු ඇතැයි විජාතික බලවේග බලාපොරොත්තු විය. එහෙත් මීසම ඒ බලාපොරොත්තු ඉටුකිරීමට අසමත් වී ඇත. එපමණක් නොව මීසමට කොටි සංවිධානය මනාව පාලනය කිරීමටද නොහැකිවී ඇත. අද කොටි තම ස්වාමිවරුන් වූ බටහිරයන්ටද ඇහුම්කන් නොදෙන තත්ත්වයකට පත්වී ඇත. එසේ වුවද මීසම හැකිතාක් දුරට පවත්වාගෙන යෑමට බටහිරයන් උත්සාහ දරනු ඇත. ඔවුන් ඒ සඳහා අවශ්‍ය පරිදි ආණ්ඩුවට බලපෑම්ද කරනු ඇත. මෙතරම් ඇස්පනාපිට පක්ෂග්‍රාහී ප්‍රතිපත්තියක් අනුගමනය කරද්දීත්, නෝර්වේ හෝ මීසම හෝ ගෙදර යැවීමට නොහැකි වී ඇත්තේ බ්‍රිතාන්‍යයේද අනෙක් රටවලද බලපෑම් නිසා බව අවධාරණය කළ යුතුව ඇත.

එහෙත් මීසමට යම්කිසි අවස්ථාවකින් පසුව තවදුරටත් කටයුතු කිරීමට නොහැකි තත්ත්වයක් උදාවිය හැකි බව බටහිරයෝ දනිති. ඔවුන් ඒ සඳහා කල්තබා සූදානම් වනු දැකිය හැකිය. මීසමට කළ නොහැකි වූ දේ කිරීමට විජාතික බලවේග බලාපොරොත්තු වන්නේ ඊනියා එක්සත් ජාතීන්ගේ හමුදා උපයෝගී කරගනිමින්ය. එක්සත් ජාතීන්ගේ හමුදා යනුවෙන් හඳුන්වනු ලැබුවද ඒ හමුදා අවසාන වශයෙන් මෙහෙයවනු ලබන්නේ බටහිරයන්ට අවශ්‍ය ආකාරයටය. ඒ හමුදා ලංකාවේ වැනි ප්‍රශ්න ඇති රටවලට (එනම් බටහිරයන්ගේ මෙහෙයවීමෙන් හෝ අනුග්‍රහය යටතේ හෝ සුළු ජනවර්ගයක් මහා ජන වර්ගයට හෝ ජාතියට හෝ විරුද්ධව අවි අතට ගත් රටවලට) ගියවිට රට බෙදීම වැළැක්විය නොහැකි වෙයි. අද ලංකාවේද සිදු වන්නට යන්නේ මීසමෙන් හා ඊනියා සටන් විරාම ගිවිසුමෙන් කළ නොහැකි වූ රට බෙදීම ඊනියා එක්සත් ජාතීන්ගේ හමුදා ලවා සිදු කරවීමය. මීසමට වඩා එක්සත් ජාතීන්ගේ හමුදා ආක්‍රමණශීලී ගතියක් පෙන්වීම නිසා බටහිරයන්ට එලෙස හමුදා ගෙන ඒමේදී ඇතැම් ප්‍රශ්න මතුවෙයි. එබැවින් කල්තබාම ජනමතය සකස් කිරීමේ අවශ්‍යතාව වෙයි. එහිදී මුලින්ම කෙරෙනු ඇත්තේ සිංහලයන් රැවටීම ය. ජනමාධ්‍ය ආධිපත්‍ය යටතේ ඊනියා එක්සත් ජාතීන්ගේ හමුදාවලට පක්ෂපාතී ජනමතයක් ඇති කිරීමට කටයුතු කෙරෙනු ඇත. සති අන්ත පත්තර

© Prof. Nalin De Silva

කඩමාල්ලක් අවශ්‍ය අවස්ථාවේදී හමුදා ගෙන්වීම සම්බන්ධයෙන් ද විජාතික බලවේග සමඟ සිටිනු ඇත. විජාතික බලවේග මුලින්ම කියනු ඇත්තේ මේ ඊනියා යුද්ධය එක් පැත්තකටවත් ජය නොලැබිය හැකි බවත්, ඒ නිසා ආණ්ඩුවේ හා කොටි සංවිධානයේ මත අතර ඇති වෙනසද ක්‍රමයෙන් වැඩිවන බවත් ප්‍රශ්නයට පිළියමක් ලෙස ආණ්ඩුවෙන් මෙන්ම කොටි සංවිධානයෙන්ද ස්වාධීන වූ හමුදාවක් රටේ ස්වෛරීභාවය ආරක්ෂා කරගැනීමට ගෙන්විය යුතු බවත්ය. ඊනියා එක්සත් ජාතීන්ගේ හමුදා ගෙන එනු ඇත්තේ රටේ ස්වෛරීභාවය ආරක්ෂා කිරීමට යැයි කියමින්ය. එහෙත් අවසානයේ දී ආරක්ෂා නොවන්නේ ද ස්වෛරීභාවයම ය.

අසමත් මීසම ඔස්ලෝ ප්‍රකාශය ඔස්සේ කිරීමට බලාපොරොත්තු වූයේ ජිනීවා සාකච්ඡාවලින් පසුව ඇතිවූ ප්‍රචණ්ඩත්වය ආණ්ඩුවේ ගිණුමට බැර කිරීමටය. බටහිරයන් හැමදාමත් අනුගමනය කර ඇත්තේ ඒ ක්‍රමයමය. ප්‍රශ්නයේ මුලදීම මෙන් බ්‍රිතානිහු ඉංගිරිසි උගත් දෙමළ ජනයාට විශේෂ වරප්‍රසාද දී දෙමළ ජාතිවාදය පෞතිස්ම කළහ. සිංහලත්වයට එරෙහිව දුන් වරප්‍රසාද නැති කිරීමට සිංහලයන් පසුව ක්‍රියා කිරීම ආරම්භ කළ විට, එය දෙමළ ජනතාවට කරන ලද අසාධාරණයක් යැයි බටහිරයෝ ප්‍රචාරය කළහ. දෙමළ ජාතිවාදී සංවිධාන ආයුධ අතට ගත්තේ හැටේ දශකයේ අග භාගයේදීය. ප්‍රභාකරන් තම මිනීමැරුම් ආරම්භ කළේ දෙමළ ජනයා ම ඝාතනය කරමින්ය. එහෙත් බටහිරයන් හා ඔවුන්ගේ අනුග්‍රහය ලබන දෙමළ ජාතිවාදය ප්‍රචණ්ඩත්වයේ හේතුව ලෙස සලකන්නේ අසූතුනේ කලබලය. අසූතුනේ කලබල ඉබේට ඇතිවූවක් නොවන බව ඔවුහු නොකියති.

අසූතුනේ කලබල කළු ජූලිය ලෙස හඳුන්වන්නන් අමතක කරන කරුණක් නම් කොටි ත්‍රස්තවාදීන්ගේ මිනීමැරුම් නිසා ජූලි මාසය නොව අවුරුද්දේ සෑම සතියක්ම කළු සතියක් වී ඇති බවය. ඇතැම් විට සෑම දිනයක්ම කළු දිනයක් ලෙස නමකළ හැකි තරමට ඝාතන කොටි ත්‍රස්තවාදීන් විසින් කෙරී ඇතැයි සිතිය හැකිය. මීසම ඒ සියල්ල ගැන නිහඬ ය. මීසම හා එහි අනේවාසික නිල නොලත් ප්‍රධාන පූජකයා වූ සොල්හයිම් වහා ගෙදර යැවිය යුතුය. එහෙත් එසේ යැවිය යුත්තේ ඊනියා එක්සත් ජාතීන්ගේ හමුදාව කැඳවීමට ඉඩතබමින් නොවෙයි.

රනිල් වික්‍රමසිංහ - ප්‍රභාකරන් ගිවිසුම අත්සන් කිරීමේදී මෙන්ම ඉන්පසුවද වික්‍රමසිංහ මහතා මෙන්ම චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියද කටයුතු කළේ ස්වෛරී රාජ්‍යයක අගමැතිවරයකු ලෙස හෝ ජනාධිපතිනියක හෝ ලෙස නොව නිවට නායක නායිකාවන් ලෙසය. මීසම හා එහි අනේවාසික ප්‍රධාන පූජක සොල්හයිම් මෙතරම් බලවත් වූයේද එබැවින්ය. මහින්ද රාජපක්ෂ මහතාට, වික්‍රමසිංහ කුමාරතුංග යුවළට මෙන් නොව පිටකොන්දක් ඇතැයි අපි විශ්වාස කරමු. රනිල් වික්‍රමසිංහ දොන් ජුවන් ධර්මපාල කෙනකු වූ අතර චන්ද්‍රිකා කුමාරතුංග දෝන කතිරිනාවක වූවා ය. සිංහලයන්ගේ අවාසනාවට එකල විමලධර්මසූරිය කෙනකු නැති විය.

අසමත් මීසමේ ඇත්තේ සුදු ස්කැන්ඩිනේවියානු පූජකයන් පමණක් නොවේ. එහි සිංහල අන්නවිරාළලාද වෙති. මේ අන්නවිරාළලා තමන් සිංහලයන් ලෙස හඳුන්වාගන්නේ දැයි නොදනිමි. තමන් කටයුතු කරන්නේ ඊනියා ලෝක පුරවැසියන් ලෙස යැයි ඔවුන් සිතනවා විය හැකිය. ඒ කුමක් වුවත් මීසම නිසා අන්නවිරාළලාටත් කීයක් හෝ හොයා ගැනීමේ අවස්ථාව ද උදා වී ඇත. මේ අන්නවිරාළලා ඊනියා කළු ජූලිය ගැන කතා කරන්නේ පරල වූ කපුවන් මෙනි. මීසමේ තවත් සේවකයෝ සිටිති. ඔවුන්ට මීසම අතුපතුගෑමේ සිට විවිධ කාර්ය නියම වී ඇත. ඔවුන් ගැන විස්තරාත්මකව කතාකළ යුතු යැයි නොසිතමි. එසේ වුවද එක් කරුණක් නොකියාම බැරිය. යම්කිසි අයුරකින් අසමත් මීසම ආපසු ගොස් ඊනියා එක්සත් ජාතීන්ගේ හමුදා ලංකාවට ගොඩ බැස්සොත් ඒ හමුදාවන්ට සේවය කරන ප්‍රධාන කණ්ඩායම වනු ඇත්තේ අන්නවිරාළලා හා සෙසු සේවකයන් ය. රටක ස්වෛරීභාවය ගැන කීමට ඔවුන්ට මේ වන විටද තම ස්වාමිවරුන් ගෙන් මතවාද ලැබී ඇත. ඒ ඇතැම් මතවාදයකට අනුව අද ලෝකයේ ස්වෛරී රාජ්‍ය නැත. ගෝලීයකරණය නමින් හැඳින්වෙන බටහිර ක්‍රිස්තියානි යටත් විජිතවාදයේ නව යුගයේදී ජාතික රාජ්‍යවල බලය අඩුවී ඇතැයි මේ මතවාදවලින් කියැවෙයි. එහෙත් ඔවුන් නොකියන කතාවක් ඇත. ඒ බටහිර රාජ්‍යවල හෝ රාජ්‍ය සංගම්වල හෝ බලය ක්‍රමයෙන් වැඩිවන බවය. අසමත් මීසම ආපසු ගියද ඊනියා එක්සත් ජාතීන්ගේ හමුදා ඒමට ඉඩක් ඇත්තේ එබැවිනි. එහෙත් අප අධිෂ්ඨානශීලී නම් අපට ඒ උපක්‍රමය පරාජය කළ හැකිය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva